නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් - 2015
-----------------------------------------

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්හි 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1** **මතය**

-------

**මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතන සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**3.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.483,970,922 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.159,798,584 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.324,172,338 ක වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ගාස්තු රු.360,760,251 කින් වැඩිවීම සහ නව පාඨමාලා සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි වීම සියයට 5 කින් ඉහල යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්යසාධනය**

----------------

**සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව විද්‍යායතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා (පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළුව) පාඨමාලා සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ආදායම, වියදම් හා දළ ලාභය පිළිබඳ විස්තර පහත දැක්වේ.**

| | | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| පාඨමාලා ආදායම | රු. | 381,848,973 | 582,371,274 | 782,648,252 | 1,138,195,911 |
| සෘජු වියදම් | රු. | 171,649,995 | 308,164,021 | 510,773,271 | 514,361,234 |
| දළ ලාභය | රු. | 210,198,978 | 274,207,253 | 271,874,981 | 623,834,677 |
| දළ ලාභය ප්‍රතිශතයක් ලෙස (සියයට) | | 55.04 | 47.08 | 34.73 | 54.80 |
| ප්‍රචාරණ වියදම | රු. | 972,805 | 6,204,841 | 5,186,354 | 7,961,906 |
| පාඨමාලාවලට සහභාගිවූ ශිෂ්‍ය සංඛ්‍යාව | | 2,212 | 2,364 | 1,979 | 2,080 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දී බඳවාගෙන තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව සිසුන් **101** කින් එනම් සියයට **5.1** කින් වැඩිවී තිබුණද **2013** වර්ෂයට සාපේක්ෂව සිසුන් **284** කින් එනම් සියයට **12** කින් අඩුවී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවාරණ වියදම රු.**2,775,552** කින් හෙවත් සියයට **53.5** කින් වැඩිවී තිබුණද පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබුණු සිසුන් සංඛ්‍යාව **101** ක් පමණි.

(ඇ) ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව විද්‍යායතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උපාධිධාරීන් **2,862** දෙනෙකු හා පශ්චාත් උපාධිධාරීන් **197** දෙනෙකු බිහිකර තිබුණු අතර ශිෂ්‍යයින් **719** දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි .

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට විද්‍යායතනයේ තථ්‍ය සේවක සංඛ්‍යාව **55** ක් වුවද කාර්ය මණ්ඩලය අනුමත කර නොතිබුණි.

## 5 පද්ධති හා පාලනයන්

විගණනයේදී පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු නිරීක්ෂණය වූ බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) වර්ෂයේ ලැබීම් හා වර්ෂයට අදාල ආදායම වෙන වෙනම හඳුනා ගැනීමට පරිඝණක පද්ධතියේ පහසුකම් නොමැතිවීම හේතුවෙන් විද්‍යායතනය ආරම්භයේ සිටම වාර්ෂිකව ලැබීම් හා වර්ෂයට අදාල ආදායම සහ විලම්භීත ආදායම වෙන වෙනම ගණනය කර ගැලපිළි සටහන් යෙදීමට සිදුවීම. |
| | (ii) ලෙජර් ගිණුම්වලට ඇතුලත් කරන ලද ජර්නල් සටහන් නිවැරදිව හඳුනාගානීමට හැකි අයුරින් ජර්නල් සටහන් අනු පිළිවෙලට අංක නොකිරීම. |
| | (iii) ගිණුම්කරණ මෘදුකාංගය යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |

| | | |
|---|---|---|
| **(ආ)** | **වත්කම් කළමණාකරණය** | **ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.** |
| (ඇ) | **ගබඩා පාලනය** | **ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.** |
| (ඈ) | **අභ්‍යන්තර පාලනය** | **නිසි වැඩ බෙදීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් මුදල් භාර ගැනීම හා ගිණුම්ගත කිරීම එක් පුද්ගලයකු විසින් සිදු කිරීම.** |